# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 35 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ: ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

**1983 අංක 35 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 04 වන දින.]

එල්. ඩී.—ඕ. 33/83.

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 35 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතෙහි 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— — 1978 අංක 2 දරන පනතෙහි 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මහාධිකරණ යෙහි සංයුතිය.

4. ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය ලේඛනෝප ගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර එය—

(අ) " මහාධිකරණ විනිශ්චයකාරවරයා " යනුවෙන් එක් එක් විනිශ්චයකාරවරයා හඳුන්වනු ලබන දස දෙනකුට අඩු නොවන්නා වූ ද විසි දෙනකුට වැඩි නොවන්නා වූ ද විනිශ්චයකාරවරයන්ගෙන් ;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111අ ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන මහාධිකරණ කොමසාරිස්වරයන්ගෙන්

සමන්විත විය යුතු ය. ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111අ ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මහාධිකරණ කොමසාරිස්වරයකු නොවන) මහාධිකරණ විනිශ්චයකාරවරයකු විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට එක විය යුතු ය. " .

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි " ඒ විනිශ්චයකාරවරයාට පවරා දෙනු ලැබිය හැකි ය. " යන වචන වෙනුවට " ඒ විනිශ්චයකාරවරයාට පවරා දෙනු ලැබිය හැකි ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111අ ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ සෑම මහාධිකරණයක කොමසාරිස්වරයකු ම, සිය පත්වීමේ අධිකාර පත්‍රයෙහි දක්වෙන අධිකරණ කලාපය තුළ මහාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුතු ය " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

ඒ 72049—10,700 (83/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.